# කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය - 2011

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පාඨමාලා ගාස්තු

(i) උපචිත පදනම මත පාඨමාලා ගාස්තු අදායම් ගිණුම්ගත නොකර පාඨමාලා පැවැත්වීමට වැයවූ වියදමට සමාන වටිනාකමක් වූ රු.1,272,090 ක් ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ එසේ වියදම ඉක්මවා ලැබුණු පාඨමාලා ගාස්තු මුදල "ඉදිරියට ලැබූ ආදායම්" ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ii) 2011 දෙසැම්බර් 31 දින වනවිට අවසන්ව තිබූ පාඨමාලා 03 කට අදාලව අයවී තිබූ පාඨමාලා ගාස්තුවලින් ඉතිරිව තිබූ රු.106,145 ක් වර්ෂයේ ආදායමට බැර කරනු වෙනුවට "ඉදිරියට ලැබූ ආදායම්" ලෙස ගණුම්ගතකර තිබුණි.

1.2.2 නොසැසඳුනු පාලන ගණුම්

ආපසු ගෙවිය යුතු පුස්තකාල තැන්පතු ගිණුමේ ශේෂය රු.227,500 ක් වුවද, උප ලේඛනයේ ශේෂය රු.247,500 ක් වූ බැවින් එම ශේෂයන් අතර රු.20,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 1.2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1999 අංක 01 දරන ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතන නියමාවලිය 12 වගන්තිය | එක් වර්ෂයක් තුළදී අවස්ථා 10 කට නොඅඩු වාර ගණනක් ශාස්ත්‍රීය කමිටු පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී ශාස්ත්‍රීය කමිටු 05 ක් පමණක් පවත්වා තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ. 135 | මූල්‍ය පාලනය සම්බන්ධ කාර්යයන් පවරා දී නොතිබුණි. |
| (ii) මු.රෙ 371(2) | වැඩසටහන් හා වැඩමුළු ආදියේ වියදම් දැරීම සඳහා රු.20,000 සිට රු.171,500 දක්වා අවස්ථා 04 කදී අත්තිකාරම් මුදල් ලබා දී තිබුණි. |
| (iii) මු.රෙ 396 | නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල වලංගු කාලය ඉක්මවූ රු. 7,320 ක් වටිනා චෙක්පත් 06 ක් නිරවුල්කර නොතිබුණි. |
| (iv) මු.රෙ. 570 හා 571 | 2004 - 2010 අතර කාලය තුළ පාඨමාලා හදාරා අවසන් කර තිබූ ශිෂ්‍යයින් 45 දෙනෙකුගෙන් පුස්තකාල තැන්පතු ලෙස ලබා ගන්නා ලද රු.112,500 ක් අදාල ශිෂ්‍යයින් වෙත ගෙවීමට හෝ නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි. |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2011 වර්ෂයට පෙර මිලදීගත් ස්ථාවර වත්කම් සඳහා පොදු ආකෘති පත්‍ර 287 ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

(i) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්ථන වියදම් සඳහා රජයේ ප්‍රදානය හා ආදායම් හා වියදම් ගිණුමට සාවද්‍ය ලෙස බැරකළ රු.80,500 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු.9,086,796 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.8,430,218 ක් වී තිබණි. සමාලෝචිත වර්ෂයෙ පුනරාවර්ථන වියදම් සඳහා ලැබුණු රු.7,674,573 ක්වූ රජයේ ප්‍රදානය හා රු.80,500 ක්වූ ඉහත සාවද්‍ය ගැළපීම හේතු කොට ගෙන ඌනතාවය රු.1,331,723 ක් දක්වා අඩුවී තිබූ අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රු.5,855,000 ක් වූ රජයේ ප්‍රදානය හේතු කොට ගෙන එම ඌනතාවය රු.2,575,218 ක් දක්වා අඩුවී තිබුණි. රජයේ ප්‍රදානය වැඩිවීම හා ස්ථාවර වත්කම් සඳහා වූ වර්ෂයේ ක්ෂය ප්‍රමාණය 36% කින් අඩුවීම හේතුවෙන් පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය අඩුවී තිබුණි.

(ii) 1999 වර්ෂයේ ස්ථාපනය කරන ලද මෙම ආයතනය සඳහා ලෝක බැංකු ව්‍යාපෘතිය මගින් රු.23,132,739 ක්ද 2011 දෙසැම්බර් 31 දින වනවිට රජයේ ප්‍රාග්ධන ප්‍රදාන රු.4,244,585 ක්ද යොදවා තිබූ නමුත්, මෙහෙයුම් කටයුතුවලින් වාර්ෂිකව ජනිතවූ ඌනතාවය හේතුවෙන් පොදු සංචිත ගිණුමෙහි රු.24,446,826 ක හර ශේෂයක් ජනිතවී තිබුණි. ආයතනය ගොඩනැගීමෙන් බලාපොරොත්තු වූ අරමුණු සාර්ථකව ඉටු නොවීම හේතුවෙන් මෙම තත්ත්වය ඇතිවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ලෝක බැංකුවේ දෙවන සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘති ආධාර යටතේ ස්ථාපිත කර ඇති ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ මූලික අරමුණ වාර්ෂිකව සිසුන් 300 - 400 ක් අතර ප්‍රමාණයක් පුහුණු කිරීම වූ නමුත් පාඨමාලා ආරම්භ කරන ලද 2003 වර්ෂයේ සිට 2011 දක්වා වර්ෂ 09 ක් තුළ පාඨමාලා 63 ක් යටතේ ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව 1,451 ක් පමණක් වී තිබුණි. එයින්ද මෙතෙක් අවසන් කර නැති පාඨමාලා 09 ක හැර ඉතිරියෙහි සිසුන් 629 දෙනෙකු පාඨමාලා සාර්ථකව අවසන් කර නොතිබ අතර, එය ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 46% ක් වී තිබුණි.

| වර්ෂය | පාඨමාලා සංඛ්‍යාව | ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාව | පාඨමාලාව සාර්ථකව අවසන් කල සිසුන් | |
|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| | | | | % |
| 2004.12.31 දක්වා | 09 | 344 | 201 | 58 |
| 2005 | 08 | 191 | 80 | 42 |
| 2006 | 06 | 133 | 70 | 53 |
| 2007 | 10 | 215 | 96 | 45 |
| 2008 | 06 | 178 | 114 | 64 |
| 2009 | 09 | 215 | 114 | 53 |
| 2010 | 05 | 60 | 32 | 53 |
| | 03 | 32 | පාඨමාලා අවසන්වී නැත | - |
| 2011 | 01 | 10 | 10 | 100 |
| | 06 | 73 | පාඨමාලා අවසන්වී නැත | - |
| | 63 | 1,451 | 717 | |

(ආ) 1999 අංක 01 දරන ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතන නියමාවලියේ 04 වගන්තිය ප්‍රකාරව ආයතන පිහිටුවීමෙන් බලාපොරොත්තුවූ පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීමට අවධානය යොමුවී නොතිබුණි.

- පුස්තකාල හා විඥාපන විද්‍යා පිළිබඳ පර්යේෂණ කිරීම.
- ආයතනයේ පරමාර්ථවලට සමාන හෝ සාරානුකූලව සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හෝ විදේශීය විශ්ව විද්‍යාල ආයතන සමඟ ආචාර්යවරුන්, ශිෂ්‍යයින් හා ශාස්ත්‍රධරයින් හුවමාරු කරගැනීමේ හෝ අන්‍යාකාරයෙන් සහයෝගයෙන් කටයුතු කිරීම.
- අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ප්‍රදර්ශන, ජාත්‍ර දක්ෂිණා ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග ඇති කිරීම හා ප්‍රදානය කිරීම.

(ඇ) 2011 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් පහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

i. ව්‍යවහාරික තොරතුරු කළමනාකරණ ශාස්ත්‍රපති පාඨමාලාව (නව) (MAIM)
ii. තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමාව (DIM) (නව)
iii. විදේශ සහයෝගිතා වැඩසටහන්

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

### 3.2.1 පාඨමාලා පැවැත්වීම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ආයතනයේ අනුමත කථිකාචාර්ය තනතුරු තුනෙන් එක් තනතුරක් වසර ගණනාවක සිටම පුරප්පාඩුවී තිබුණි.

(ආ) පාඨමාලා 03 ක් අවසන් කිරීමට සැලසුම් කළ කාලයට වඩා මාස 04 ක් හා මාස 05 ක් ප්‍රමාදවී තිබුණි.

(ඇ) පාඨමාලා අයවැය ලේඛන නිසි වේලාවට සකස් නොකිරීම සහ අයවැයගත හා සත්‍ය වියදම් අතර පැවති ප්‍රමාණාත්මක විචලතාවය හේතුවෙන් එම අයවැය ලේඛන පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

(ඈ) පාඨමාලා ගාස්තු ආදායම් ලේඛනය, නිසි අධීක්ෂණයක් සහිතව නඩත්තු කර නොතිබුණි.

### 3.2.2 පුස්තකාලය නඩත්තුව හා පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුස්තකාලයට පොත් මිලදී ගැනීමේදී විධිමත් ක්‍රමවේදයක් නොතිබීම.

(ආ) පුස්තකාලය පරිහරණය කරන සිසුන් සංඛ්‍යාව ඉතා අවම වීම හේතුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට රු.6,947,597 ක් වූ පොත් හා උපකරණ ඌන උපයෝජිතව පැවතීම.

(ඇ) කාර්යමණ්ඩලයේ නිලධාරීන් 06 දෙනෙකු වෙත පොත් 03 - 14 ත් අතර සංඛ්‍යාවක් එකවර බැහැරදී තිබූ අතර, ඒවා ආපසු භාරනොදමේ කාලය මාස 01 සිට වසර 02 කුත් මාස 05 ක් දක්වා වීම.

(ඈ) 2011 දෙසැම්බර් 31 දිනට භෞතික සමීක්ෂණ වාර්තාව අනුව අස්ථානගතවූ පොත් 115 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබීම.

### 3.2.3 තොග පාලනය

ලිපි ද්‍රව්‍ය ලැබීම්, නිකුත් කිරීම් හා ශේෂයන් පැහැදිලිව දැක්වෙන ආකාරයට තොග ලේඛනය නඩත්තු කර නොතිබුණි.

3.3. ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

2011 අප්‍රේල් මාසයට අදාල සේවක භාරකාර අරමුදල් නියමිත දිනට නොගෙවීම මත රු.1,822 ක් වූ අධිභාර ගෙවීමට සිදුවී තිබුණි.

3.4 වාහනය උපයෝජනය

-------------------------

වර්ෂ 08 කට පෙර අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ලබා දෙන ලද පිරිවැය රු.3,603,493 ක්වූ වාහනය මේ දක්වාම ආයතනය නමින් ලියාපදිංචිකර නොතිබූ අතර, එම වාහනයේ ධාවන සටහන් හා ලොග් පොත් සටහන් අසම්පූර්ණව පැවතුණි.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

4.1 සංයුක්ත සැලැස්ම

--------------------

2011 - 2015 කාලය සඳහා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මෙහි ආයතනයේ පවතින සම්පත් පිළිබඳ තොරතුරු, ආයතනයේ සංවිධාන ව්‍යුහය සහ අරමුණු හා ඉලක්කගත සැලසුම් සමඟ ආයතනයේ කළමනාකරුවන්ට වගකීම් පැවරෙන පරිදි ක්‍රියාකාර සැලැස්ම සකස්කර නොතිබූ අතර සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි.

4.2 ක්‍රියාකාර සැලැස්ම

---------------------

ක්‍රියාකාර සැලැස්මෙහි ඒ ඒ කාර්යයන් ඉටුකිරීමට අපේක්ෂිත කාලය හා වෙන්කරන ලද මුදල් ප්‍රමාණය දක්වා නොතිබූ අතර කාර්යයසාධන වාර්තාද සකස්කර නොතිබුණි.

4.3 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.

4.4 අයවැය ලේඛනමය පාලනය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක PED 12 දරන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අයවැය ලේඛනය පිළියෙලකර නොතිබූ අතර, වර්ෂය තුළ සදුවූ ප්‍රතිපාදන වෙනස්වීම්වලට අනුකූලව එම ලේඛනය සංශෝධනය කරද නොතිබුණි.

(ආ) පුනරාවර්ථන වැය ශීර්ෂ 04 ක හා ප්‍රාග්ධන වැය ශීර්ෂයක ප්‍රතිපාදනය ඉක්මවා රු.1,299,686 ක් හෙවත් 12% ක් වැය කිරීමත්, ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම සඳහා වෙන්කල රු.800,000 ක මුළු ප්‍රතිපාදනයම අදාල කාර්යය සඳහා වැය නොකිරීමත් ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේ අතාත්වික බවත් හේතුවෙන් අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

4.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2010 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින්වර යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

(අ) මූල්‍ය පාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) තොග පාලනය
(ඈ) කාර්යය සාධනය
(ඉ) සැලසුම්කරණය
(ඊ) පුස්තකාලය නඩත්තුව